ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

චක්‍රලේඛ අංක 18/2026

2026.03.06

සියලු දිසා කොමසාරිස්වරුන් වෙත,

**<u>සහය දිසා කොමසාරිස් (මාධ්‍ය) සම්මන්ත්‍රණය</u>**

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සහය දිසා කොමසාරිස් (මාධ්‍ය) සම්මන්ත්‍රණය 2026 මාර්තු මස 29 වන ඉරිදා දින පෙ.ව. 9.00 ට ජාතික බාලදක්ෂ මූලස්ථානයේදී පැවැත්වීමට නියමිතය.

මේ සඳහා ඔබගේ දිසාවේ සහාය දිසා කොමසාරිස් (මාධ්‍ය) හෝ මේ වන විට එම තනතුර සඳහා නිලධාරියකු පත් කර නොමැති නම් ඒ සඳහා කාර්යක්ෂම සුදුසු නිලධාරියකු නම් කර හෝ සහභාගී කරවන ලෙස මෙයින් දන්වා සිටිමු.

එදිනට සහභාගී වන නිලධාරීන්ගේ නාම ලේඛනය 2026 මාර්තු 10 දිනට පෙර පහත ඊමේල් ලිපිනයට යොමු කරන ලෙස දැනුම් දෙනු ලැබේ.
slscout2@yahoo.com

මෙම සම්මන්ත්‍රණයට අදාල විස්තර සහ වැඩසටහන ඉදිරියේදී දැනුම් දෙනු ඇත.

මෙම වැඩසටහනේ දී සෑම සහය දිසා කොමසාරිස්වරයකුටම මෙම වසරේ තම දිසාවේ මාධ්‍ය ආවරණ කටයුතු සම්බන්ධව බහු මාධ්‍ය ඉදිරිපත් කිරීමක් (15 Slides) කිරීමට සිදුවන අතර ඒ සඳහා එක් අයෙකුට විනාඩි දෙකක කාලයක් ලැබෙයි.

මෙම සම්මන්ත්‍රණයට සහභාගි වීමේදී සියලු සහය දිසා කොමසාරිස්වරුන් තම දිසාව වෙනුවෙන් facebook instagram හා youtube සමාජ මාධ්‍ය ගිණුම් සකසා තිබීම අනිවාර්ය වේ.

සියලු දෙනා 2026 වර්ෂයේ තම දිසාවේ B.P දින සැමරුම් උත්සවයේ මාධ්‍යාවරණ කටයුතු සම්බන්ධව වාර්තාවක් සකසා දිසා කොමසාරිස් නිර්දේශ සහිතව රැගෙන පැමිණිය යුතු ය.

මෙම සම්මන්ත්‍රණය මහත් පරිශ්‍රමයක් දරා සංවිධානය කර ක්‍රියාවට නගන බව අවධාරනය කරමු.එබැවින් අදාල සම්මන්ත්‍රණයට යොමු කරන සහාය දිසා කොමසාරිස් (මාධ්‍ය) වරයා ක්‍රියාශීලීව වසරකට වඩා වැඩි කාලයක් ඔහුගේ සේවය ලබා දිය යුතුව ඇත.

එනිසා උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ දැඩි අවධානය යොමු කොට අපගේ ක්‍රියාදාමය සාර්ථක කරගැනීම සඳහා සුදුසු ම පුද්ගලයකු තෝරා අපවෙත යොමු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමු.

ස්තුතියි.

මෙයට,

බාලදක්ෂ සේවයේ නියුතු,

**ප්‍රභාත් කුලරත්න**
සහය ප්‍රධාන කොමසාරිස්
(මාධ්‍ය/මහජන සම්බන්ධතා,ප්‍රවර්ධන)

**නීතීඥ මනෝජ් නානායක්කාර**
ප්‍රධාන කොමසාරිස්

පිටපත්- මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්
සභාපති,විධායක කමිටු සභාපති,ගරු ලේකම්,ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka
Tel : + 94 112 433131 /+94 112 433512
FAX : + 94 112 433131
E -mail : slsaheadq@gmail.com
web : www.scout.lk